සූරියකන්ද භේදවාචකය



01 කොටස

# Indian සාගරයේ ශාපලත් දේශය : 1989

# ඇඹිලිපිටිය සූරියකන්ද භේදවාචකය




**ධර්මිෂ්ඨ සමාජයක කළු බළල්ලු**

ඒකීය රාජ්‍යයකට විරුද්ධව, දෙමළ සටන්කාමීන්, අතුරු හමුදා හරහා දිවයිනේ උතුරු - නැගෙනහිර ප්‍රදේශවල අප්‍රකටව සටන් වදිද්දී දකුණේ භීෂණය තුළ කොළ කොටි, ප්‍රා, කළු බළල්ලු, කහ බළල්ලු, කඳුකර රාජාලියා වැනි මාරක කල්ලි, පාලක කල්ලි සමග ප්‍රසිද්ධියේ හිත මිතුරු වී, තවත් රාජ්‍ය භීෂණයක් ගෙන ගියහ. පොදු මහජනයාගේ බෙලහීන ශක්තිය දඩමීමා කරගෙන පැතිර ගිය මේ ව්‍යාධිය 1989 දී සූරියකන්දෙන් මතුවිය.

එහි ආතිසංස ඉතා හෙමින් ප්‍රසිද්ධ වුවද, සංත්‍රාසය යුග ගණනක් පුරා දෝංකාර දුන්නේය. සූරිය කන්දේ ඒ සිසුන් 32 දෙනාගේ බිහිසුණු භේදවාචකය එහි පළමු වැන්නය.

සිසුන් 32

1.රසික කුමාර විජේතුංග
2.චාමර සුදර්ශන ජයසේන
3.සුසිල් කුමාර
4.රුවන් රත්නවීර
5.නිලන් මානෙල්ක ද සිල්වා
6.රවින්ද්‍ර ඉඳුනිල් පරණවිතාන
7.නලින් කුමාර ගුණරත්න
8.උදේශ් කාවින්ද සෙල්ලහේවා
9.ප්‍රසන්න හඳුවල
10.පාලිත ලක්ෂ්මන් ගුරුගේ
11.මහින්දපාල වික්‍රමසිංහ
12.H. P. D. පාලිත
13.අනුර ප්‍රිය සමන්ත
14.වසන්ත ප්‍රිය සමන්ත
15.ඇලෝසියස් ස්ටීවන්
16.ප්‍රභාත් කුමාර
17.ප්‍රදීප් විජේසිංහ
18.ධම්මික කුමාර බෙරගමආරච්චි
19.P. H. D. නිහාල්
20.ප්‍රදීප් මල්වත්ත
21.කේ. පියසිරි
22.ඇල්ෆ්‍රඩ් පාලිත
23.සනත් ප්‍රියන්ත
24.ජයසිරි හෙට්ටිගම
25.ජගත් දිසානායක
26.ජනක ජයවර්ණ
27.දයානන්ද ඒකනායක
28.එන්. විජේ සිංහ
29.කලංචිගේ කරුණාසේන
30.අජිත් සෝමරත්න
31.වයි. සුසන්ත
32.එන්. ජයතිලක

**ඔත්තුව ලැබුණු හැටි**

නමින් පෙනී සිටීමට අකමැති පුද්ගලයකු විසින් එක්තරා පුවත්පතකටත් විපක්ෂ මන්ත්‍රීවරයෙකුටත් සිතියම් සහිත විස්තරයක් සපයන ලදී.

රක්වාන දෙනියාය පාරේ සූරියකන්ද නගරයට කිලෝමීටර් දෙකහමාරකට මෙපිටින් 116 වැනි කිලෝමීටර් කණුව ආසන්නයේ කඩමුදුන ගම්මානය පිහිටා ඇත. කඩමුදුන හන්දියෙන් දකුණට ඇග්බර්ත් තේවත්තේ ඇබර් ෆොයිල් ඩිවිෂණය හරහා සූරියකන්දේ ටෙලිකොම් හා රූපවාහිනී කුලුනු ඇත.

> **ඇඹිලිපිටියෙන් අතුරුදන් වූ පාසල් සිසුන් තිස් දෙදෙනා ඇතුළු අති විශාල පිරිසකගේ සිරුරු මෙම වළවල්වල බහා තිබේ. මෙයින් එක වළක කටු සහිත වැල් වැවී තිබේ. සෙසු වළවල් හඳුනාගත හැක්කේ ඒ මත සරුවට වැඩී ඇති තණ හා මාන පඳුරු වලිනි.**


එම මාර්ගය කිලෝමීටර් එකහමාරක් පමණ යන විට ඇඳි පාලමක් හමු වේ. එම ඇඳි පාලම යටින් ගලායන ඔයකි. ඇඳි පාලම මත සිටගෙන ඔය පාරේ බැස්ම දෙස බලන විට පාලමේ සිට තරමක් ඉදිරියෙන් අලුත් පස් සහිත පස් කන්දක් හමු වේ. එතන භික්ෂූන් වහන්සේලා දෙනකුගේ සිරුරුවල දමා තිබේ.

ඇඳි පාලමේ සිට කිලෝමීටර් දෙකක් පමණ කන්දේ ඉදිරියට ගිය විට, සූරියකන්දේ ලංකා ටෙලිකම් කුලුනු සහ රූපවාහිනී කුලුනු හමු වේ. ඉන් ඔබ්බට ඇත්තේ සිංහරාජ වනාන්තරයය. එම පාරේ අවසාන වංගුවේ රූපවාහිනී කුලුනුවලට පහළින් ලංකා ටෙලිකොම් ආයතනය, කුලුනකට අදාළ මැන් හෝල් (Manhole මනු සිදුර) එකක් ඇත. එය මතට වී ඉදිරිය බලන විට මීටර් තිහක් පමණ දිග බුල්ඩෝසර් කැපුමක් දක්නට හැකියි. එම බුල්ඩෝසර් කැපුමේ වළවල් තුනක් තිබේ. රූපවාහිනී කුලුන සඳහා කණිනු ලැබූ, නමුත් ගල මතුවීම නිසා අත්හැර දැමූ, එක් වළකි. එය සාමාන්‍යයෙන් අඩි 20 - 30 පමණ ගැඹුරුය. අනෙක් පැරණි වළවල් දෙකක ඇඹිලිපිටියෙන් අතුරුදන් වූ පාසල් සිසුන් තිස් දෙදෙනා ඇතුළු අති විශාල පිරිසකගේ සිරුරු මෙම වළවල්වල බහා තිබේ. මෙයින් එක වළක කටු සහිත වැල් වැවී තිබේ. සෙසු වළවල් හඳුනාගත හැක්කේ ඒ මත සරුවට වැඩී ඇති තණහා මාන පඳුරු වලිනි. මේ ස්ථානය මුහුදු මට්ටමෙන් වැඩි හාරදාස් හාරසීයක් උසය. ඒ නිසාම දැඩි සීතලය. දැඩි ශීත නිසාම මෙම මළ සිරුරු බොහෝ විට නරක් නොවී තිබිය හැක. මුළුමනින් ම දිරාපත් වීමක් නම් මේ දේශගුණය යටතේ සිදු නොවෙන්නේ ය.



මෙම ප්‍රදේශය ආරක්ෂිත තහනම් කලාපයකි. 1988 - 1989 අවධියේ මෙහි ආරක්ෂාව සඳහා කාලතුවක්කු හමුදා සේනාංකය නතර කර තිබුණේය. අති විශේෂ පොලිස් ඒකකයක්ද තිබේ. කොළොන්න පොලිසිය යටතේ පිහිටා තිබෙන මෙම පොලිස් මධ්‍යස්ථානයේ උප පොලිස් පරීක්ෂකවරයෙක් හා පොලිස් හටයෝ පහක් දිවා රාත්‍රී ආරක්ෂක කටයුතුවල නිරතව සිටිති.

පණිවිඩ ක්‍රමයේ වෘද්ධිතා සැලැස්ම යටතේ සමාගමකට සූරියකන්දට යාබද සිංහරාජ අඩවියේ කඳු මුදුනේ විදුලිබල මණ්ඩලයේ කුලුනක් ඉදිකිරීම, "මරුබෙනිට්' නමැති ජපන් සමාගමට පවරා තිබෙනවා. කඳු මුදුනට කුලුනේ කොටස් ගෙන යෑම සඳහා මාර්ගයක් ඉදිකිරීමට කොළඹ කපිල ආර්. ඉංජිනියර්ස් සමාගමට අතුරු කොන්ත්‍රාත්තුවක් පවරා ඇති අතර එම පාර ඉදිකිරීමට සැලසුම් කොට ඇත්තේ, මෙම මිනී වළවල් සහිත ඩෝසර් කැපුම් හරහා ය. එම මාර්ගය ඉදිකිරීම සඳහා එම ස්ථානයේ අඩි පහළොවක් විස්සක් උසට පස් පිරවිය යුතු අතර, එය ඉදිවුවහොත් මෙම මහා මිනී වළවල් සදහටම වැසී යාමට ඉඩ තිබේ.



මේ අතර ඇඹිලිපිටිය අතුරුදන් කළ පාසල් සිසුන්ගේ මවුපියන් සංවිධානයේ ලේකම් එස්. එම්. චන්ද්‍රපාල ද සිල්වා මහතා දෙසැම්බර් 12 දා 'රාවය' පුවත්පත කළ හෙළිදරව්ව ගැන සඳහන් කරමින් සූරියකන්දේ රහසිගතව වළදමා ඇති මළ සිරුර ගොඩ ගැනීම සඳහා පියවර ගන්නැයි ජනාධිපති අගමැති ඇතුළු රජයේ වගකිව යුත්තන්ගෙන් ද අයැද සිටියේය. ඒ අනුව රජයේ වගකිව යුත්තන් යම්කිසි පියවරක් ගනු ඇතැයි ඉවසීමෙන් සති තුනක් පමණ බලා සිටියේය. රජයෙන් පියවර ගැනීමට දක්වන මැළිකම හා උදාසීන භාවය ඉදිරියේ මහා මිනී වළවල් සදහටම වැසී යෑම වළකනු පිණිස පියවරක් ගැනීමට මිනිසුන්ගේ සහාය පැතීමට සිදු විය.

මිනී වළවල් පිහිටි ස්ථානය විශේෂ ආරක්ෂක කලාපයක් නිසාත්, ඒ අසලම පොලිස් ස්ථානයක් පිහිටි නිසාත්, මෙම සිරුරු ගොඩ ගැනීම සංකීර්ණ කාර්යයකි. එහි ඇතුළු වීම වැළැක්වීමට ආණ්ඩුව පියවර ගන්නා බව පැහැදිලි හෙයින් සංවිධාන කටයුතු අතිශයින් රහසිගත විය යුතු විය. තවත් බොහෝ වැදගත් තැන්වල පවා තිබෙන මෙවැනි මහා මිනී වළවල් ගොඩගැනීමට රජයට බලපෑම් කරනු පිණිස, මෙම ගොඩගැනීම සඳහා අන්තර්ජාතික වශයෙන් ප්‍රසිද්ධියක් ලබා දීමද අනිවාර්ය විය.

**(භීෂණ සමයේ ශ්‍රී ලංකාවේ සිටි ඇමෙරිකන් පුවත්පත් කලාවේදියෙකු වන ස්ටීවන් කෝල්ගේ සටහනකින් උපුටා ගන්නා ලදී)**

සැකසුම:රවිප්‍රසාද් හේරත්

**රහස් පොලිසියේ සහතිකය ලබන සතියේ.**